# නිකොලායි නොසොව්ගේ ළමා කතා සාහිත්‍යය

## (තෝරාගත් නිර්මාණාශ්‍රයෙන් කෙරෙන සංක්ෂිප්ත විමර්ශනයකි)

**එස්. බී. අනුරුද්ධිකා කුමාරි කුලරත්න**

Nikolai Nosov is esteemed by Soviet children as the King of Amusement and Jocularity. The Central Persona of his short stories and novels are conscientious, quickwitted, and ingenuous day dreamers; some of them are idle while some are vigorous and dynamic. Nosov's creations have long been loved by children the world over. More than one generation has been helped by their flourishing and placid humour to comprehend the demand for candid human respectability in all its facets. An attempt has been made in this article to examine the special features apparent in Nosov's Stories.

එක්දහස් නවසිය හැත්තෑවෙන් ආරම්භ වන දශකයෙහි (1970-1980) අග භාගයෙහි පමණ එවකට පූර්ව, මධ්‍යම හෝ පසු ළමා වියෙහි හුන් සිංහල බාලක බාලිකාවන්ගේ මනරංජනය කළා වූ ද විශ්‍රාන්තිය අර්ථවත් කළා වූ ද රසනීය ප්‍රවාහයක් වශයෙන් සෝවියට් රුසියානු ළමා සාහිත්‍යය හඳුන්වා දිය හැකිය.[1] පින්තූර කථා කෘතියෙහි චිත්‍රිත සජීවිමත් සත්ත්ව ලෝකයේ අසිරිය, රුසියන් ජන කතාන්දරවලින් සමීපස්ථ වූ වසිලීස්සා, බබායිගා යකින්න, මාරියා මොරේව්නා රැජින බඳු අපූර්ව චරිත එවක පැටිවියෙහි හුන් පාඨක ප්‍රජාවගේ සෞන්දර්යයාත්මක අවශ්‍යතා පූරණය කළා පමණක් නොව ඔවුන්ගේ පරිකල්පනය දල්වා ලූ පහන්සිළු වශයෙන් ක්‍රියාත්මක වූ හයි කීම නිරවද්‍ය යැයි හැඟෙයි.

---

© එස්. බී. අනුරුද්ධිකා කුමාරි කුලරත්න

සංස්. ආචාර්ය පූජ්‍ය මීමුරේ ගුණානන්ද හිමි, මහාචාර්ය ඊශා හේවාබෝවල, මහාචාර්ය සුසන්ත මහලුල්පත, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ප්‍රියංකර රත්නායක

**මානවශාස්ත්‍ර පීඨ ශාස්ත්‍රීය සංග්‍රහය, 20 කලාපය, 2012/13,** මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය

මහා ස්ටෙප්ස් තැන්නෙහි නිහැඬියාව බිඳ දමමින් බිරියෝසා තුරුපතරින් නික්මෙන මායාවී සරසරය ද ලාංකේය පාඨකයන්ට නෙරළු පතරෙහි සැලුම සෙයින් අනාගන්තුක වීය. විශේෂයෙන් ම ළමා පෞරුෂය වර්ධනයෙහි ලා කායික, මානසික, ආධ්‍යාත්මික හා චිත්තවේගීය ශක්තීන් අභිවර්ධනයෙහිදී ද, සන්තර්පණය කර ගැනුමෙහිදී ද රුසියානු ළමා සාහිත්‍යය නවසිය හැත්තෑව අසූව දශකයන්හි දී සශ්‍රීක තෝතැන්නක් ලෙසින් ක්‍රියාත්මක වූ වග නිරීක්ෂණය කළ හැකිය.[2] මෙම දළ විමර්ශනයෙහි දී අප විසින් අපේක්ෂා කෙරෙනුයේ සෝවියට් රුසියානු ළමා පාඨකයන් විසින් සමර්පණය කෙරුණු විනෝදාස්වාදය හා හාස්‍ය රස මැවූ ඉන්ද්‍රජාලික රජු යන අභිධානයෙන් පූජිත නිකොලායි නොසොව්ගේ ළමා සාහිත්‍ය කෘතීන්හි ප්‍රතිබිම්බිත විචිත්‍රතා හා විශේෂතා කෙරෙහි අවධානය යොමු කිරීමටය.[3]

එක්දහස් නවසිය දහහතෙහි ඔක්තෝම්බර් විප්ලවයට පෙරාතුව ග්‍රන්ථකරණයෙහි නිරත වූ ලියෝ ටෝල්ස්ටෝයි, ඇන්ටන් චෙකෝව්, ඉවාන් තුර්ගේන්‍යව්, මැක්සිම් ගෝර්කි, ඇලෙක්සැන්ඩර් කුප්රින් සහ කරල්ලොයන්තො වැනි විශ්ව කීර්තිධර සාහිත්‍යධරයන්ගේ කෘතීන'තර ළමා සාහිත්‍යය යනුවෙන් විශේෂිත වූ අතරු ශානරයක් පැවතියේ නැත. තදනන්තරව විප්ලවයට පසු අවධියෙහි දී බියැන්කි, ක්රුප්ස්කය, ගයිඩාර්, කසිල්, චුකොව්ස්කි, මාර්ෂක්, මිකල්කොව්, බාර්තෝ හා නිකොලායි නොසොව් වැනි ළමා සාහිත්‍යය ලේඛනයට ම සිය පැන් තුඩ මෙහෙය වූ සුප්‍රකට ලේඛක මන්දාකිණියක් ම රුසියානු සාහිත්‍යම්බරයෙහි ලෙලුම් - දිලුම් දෙන්නට වන්නේය. නොසොව්ගේ කෙටිකතාවන්හි හා නවකතාවන්හි නිරූපිත ප්‍රධාන ළමා භූමිකාවෝ සත්‍යවාදී හා යුක්ති සහගත ගුණින් උපේත වන්නා සේ ම කීමෙහි බිණීමෙහි සුරුබුහුටියෝ ය. අසංකීර්ණ වූත් අකපට වූත් හදවත් ජන්ම දායාද කරගත් මොවුහු බොහෝ විට සුව කළ නොහෙන පරිදි සිහිනයන්හි නිමග්න වන්නෝ වෙති. මොවුනත'රින් සමහරෙකු අතපය හකුළුවා ගත් ආලස්‍ය සුඛ විඳින්නවුන් වන අතර බහුතරය උතුරා ගලා හැලෙන ජීව ප්‍රවාහ බඳු ව උද්‍යෝගීමත් ගුණයෙන් පරිපූර්ණ වූවෝය. දළ වශයෙන් ශත වර්ෂයකට ආසන්න කාල සීමාවක පරම්පරා කිහිපයක ම පාඨකයන් නොසොව්ගේ සජීවිමත් හා සුනිශිත හාස්‍ය රස මාධ්‍යයෙන් ඉඟි කෙරුණු විනීත ශික්ෂණය හා ශිෂ්ටත්වය පිළිබඳ ව තීව්‍ර සංජානනයෙන් පරිමිත ව සුදාරකයන් බවට පරිවර්තනය වූ හයි කීම අතිශයෝක්තියක් නොවේ.

නිකොලායි නොසොව්ගේ ළමා විය හෝ යොවුන් විය රෝසමල් අතුළ යහනාවක් පරිද්දෙන් සුවබර වූයේ නොවේ. හෙතෙම වර්ෂ එක් දහස් නමසිය අටෙහි නොවැම්බර් විසිතුන් වන දින, නළු පියෙකුට දාව යුක්රේනියානු නගරයක් වූ කිව් (Kiev) හිදී ජන්ම ලාභය ලැබීය. රැගුමින් තමා උපයන මුදලින් සිය දරුවන්ට නිසි අධ්‍යාපනයක් දීමට තරම් පියා පොහොසත් නොවීය. එහි ප්‍රතිඵල වශයෙන් දහ හතර වන වියෙහි දී පාසල් ජීවිතයට සමු දී දිවි පැවැත්ම උදෙසා රක්ෂාවක නිරතවීමට යෞවන නොසොව්ට සිදුවිය. කෙසේ වෙතත් දහනව වන විය උදාවෙහි දී ස්වයං අධ්‍යාපනය උපයෝගී කර ගනිමින්, කිව් කලායතනයෙහි ප්‍රවේශ විභාගයෙන් සාමාර්ථ්‍යය ලැබීමට ඔහුට හැකි විය. එතෙකදු දෙවසරක අධ්‍යාපනය ලැබීමෙන් ඉක්බිති එවකට නව්‍යතර කලාංගයක් වූ සිනමාව විෂයය අරභයා සිත් හි නිපන් තීව්‍ර ලාලසාව හේතුවෙන් නොසොව් එකී විද්‍යාස්ථානය හැරපියා මොස්කව් අග නගරයෙහි සිනමාකරණය පිළිබඳ වූ රාජ්‍ය ආයතනයට බැඳීමට ඉටා ගත්තේය. එහිදී ශිෂ්‍යාධාර මත යැපෙමින්, ශිෂ්‍ය නේවාසිකාගාරයක වසමින්, ශිෂ්‍ය ආපන ශාලාවෙන් පහසු මිළට සැපයුණු රළු පරළු අහරින් යැපෙමින්, අවසන් මොහොතෙහි දේශනාගාර වෙත කඩිනමින් දිවෙමින්, අන්තර් ශිෂ්‍ය සංගම් විවාදයන්හි දී ආවේගාත්මක ව වාක් හරඹයෙහි නිරත වෙමින් ප්‍රරූපී විශ්වවිද්‍යාල ශිෂ්‍යයෙකුට අනුරූපී ලක්ෂණ ප්‍රදර්ශනය කරමින් කාලය ගෙවීය. සිනමාව, සිය මාධ්‍යය සතු නිර්මාණාත්මක ධාරිතාවයෙන්, නව්‍ය ආකෘති ගවේෂණයෙහි නම්නීභූත වීමෙන් හා නවීන තාක්ෂණයෙහි බලමහිමයෙන් එය වගාකර ගත් අලංකාර හා සෞන්දර්ය සම්ප්‍රදායෙන්, නොසොව් වශීකෘත කර ගනිමින් ඔහුගේ ජීවිතයෙන් දශක දෙකක් සිය ආධිපත්‍යයට නතු කර ගත්තේය. පරිකල්පන ශක්තියෙන් පරිපූර්ණ ව නව මං සොයා යෑමට පසුබට නොවූ සිනමා අධ්‍යක්ෂවරයෙකු වූ නොසොව් කාර්ටූන් චිත්‍රපටයකරණයට විශේෂයෙන් ආශක්ත වූ අතර තමා තෝරා ගත් ප්‍රස්තුත විචක්ෂණ වූත් අසාමාන්‍ය වූත් රූපාත්මක කථනයක් මාධ්‍යයෙන් සිනමාවට නැංවීය. මෙම නිර්මාණ ප්‍රේක්ෂකයන්ට සිතීමට පෙළැඹුවා පමණක් නොවේ; ඔවුනට ආනන්ද ජනක අත්දැකීමක් ද පිරි නැමුවේය. විශේෂයෙන් ම ඔහු විසින් නිර්මිත විද්‍යාත්මක හා අධ්‍යාපනික චිත්‍රපටවල යථෝක්ත ගුණ සුදර්ශිතය. දෙවන ලෝක යුද සමයෙහි දී ඔහු සිය අත්දැකීම් සම්භාරය හා

ශක්‍යතාව ආයෝජනය කළේ වාර්තාමය යුද චිත්‍රපට තැනීම පිණිසය. මෙම ප්‍රයත්නය තත් විෂයයානුබද්ධ ප්‍රාමාණික විද්වතුන්ගේ නොමඳ ප්‍රශංසාවට ලක් වූ අතර නොසොව් වෙත 1943 වර්ෂයෙහි දී සුප්‍රකට රක්ත තාරකා සම්මානය ද ළඟා කර දිණි. සිනමා ක්ෂේත්‍රයෙහි නිමග්න ව සිටි නොසොව්ගේ සිතෙහි ආරම්භයෙහි දී සාහිත්‍යයික ජීවිකාවක් පිළිබඳව ලේශ මාත්‍රයකුදු සිතුවිල්ලක් නොවීය. එහෙත් කිසියම් වෘත්තියක නිරතව සිටින්නා වූ සමහරෙකුට ජීවිතයේ ඇතැම් ක්ෂණයන්හි දී තමාගේ වෘත්තිමය ප්‍රතිභාව සැඟව ඇත්තේ අන්‍යතර ක්ෂේත්‍රයකැයි යන අවබෝධය අනපේක්ෂිත ව උදාවෙතැයි කියනු ලැබේ. නොසොව් සම්බන්ධයෙන් ද මෙම ආප්තෝපදේශය සත්‍යයකි. ප්‍රථමයෙන් ඔහු තම සිඟිති පුතණුවන්ගේ වින්දනය උදෙසා සිඟිති කතාන්දර ද, සුරංගනා කතා ද, උපමා කතා ද ගෙතීය. තදනන්තර ව මේවා මුද්‍රිත මාධ්‍යයෙන් එළි දැක්වීමෙහි දොළක් ඔහු සිත්හි හට ගති. අවසන පරිණත මිනිසෙකු වුව ද ලේඛන කලාවට ආධුනික නහඹුවෙකු වශයෙන් තම, **කවටයෝ** (The Jokers) නම් කතාව Murzilka නම් ළමා සඟරාවෙහි පළ කරවා ගැනීමට ඔහු අදාළ ප්‍රකාශන ආයතනය වෙත පිය නැගුවේ, චකිතයෙන් සැලුම් ගත් සිතිනි. ඒ 1938 වර්ෂය වූ අතර නොසොව් සිය තිස් වන වියට පය තැබුවා පමණි. එදා පටන් වචනයෙහි පරිසමාප්ත අර්ථයෙන් වෘත්තිමය සාහිත්‍යධරයකු වීමෙහි නිෂ්ටාව මුදුන් පමුණුවා ගැනීමට ඔහු තවත් බෝ දුරක් යා යුතු විය. සමාරම්භක අවධියෙහි දී නොසොවේගේ රචනා ශෛලිය සියල්ලන් විසින් එක්වන් ව පිළිගනු ලැබුවේ නොවේ. එවක සුලබ භාවිතයෙහි පැවති ආකෘතික හරඹ නිර්දය ලෙස බැහැර ලමින් නොසොව් කතන්දර කියූ අසාමාන්‍ය විධි වේදයට බොහෝ ළමා පුවත්පත් කර්තෘහු යහ ප්‍රතිචාරයක් නොදැක්වූහ. එතෙකුදු ළමා පාඨකයෝ මේ කතා කෙරෙහි එක්වන ම ආසක්ත වූවෝය. එවක රුසියානු ළමා සඟරා හා පුවත්පත් ලේඛකයාට යොමු කෙරුණු ප්‍රශංසාත්මක සන්දේශවලින් හා තව තවත් එම ගණයේ කතා සපයන්නැයි කළා වූ ආයාචනාවලින් පිරී ඉතිරී යන්නට වන. ළමා පාඨකයන්ගේ අවිහිංසක ප්‍රාර්ථනය බැහැර වූයේ නොවේ. විවිධ ප්‍රකාශනවල නොසොව්ගේ රචනා නිරතුරුව ම පළව තිබෙනු දක්නට ලැබිණි. කෙසේ වෙතත් ඔහුගේ ලේඛන කුශාග්‍රභාවය සපුරා කුසුමිත වූයේ දෙවන ලෝක යුද්ධයෙන් ඉක්බිති ව එළැඹි වකවානුවෙහිදී ය. 1945 වර්ෂයෙහි දී **ටොක් ටොක් ටොක්**

[Tock –Tock - Tock] යන මැයෙන් වූ කුළුදුල් කතා සංග්‍රහය කළ එළියට බටුයේය. දළ වශයෙන් ආසන්න සමයක දී ඔහුගේ ප්‍රථම දීර්ඝ නිර්මාණ සමුච්ඡය සංගෘහිත වූ කෘතිය මුද්‍රණ ද්වාරයෙන් එළි දැක්විණි. **Vitya Maleyev at home and at school** නම් වූ මේ ග්‍රන්ථය සමකාලීන දේශීය හා විදේශීය පාඨක ප්‍රසාදයට පාත්‍ර වූ අතර රචකයා වෙත සෝවියට් සමාජවාදී සමූහාණ්ඩු සංගමයෙහි රාජ්‍ය සාහිත්‍ය සම්මානය ද පිරිනැමිණි.[4]

නොසොව්ගේ ලේඛනයන් අතර අගසස්ඵලය ලෙස ගැණෙනුයේ ඩුනෝ [Dunno] නම් කීඩෑ පැංචකු අරබයා ගෙතුණු ග්‍රන්ථ ත්‍රිත්වයය.[5] කුසුම් පුරය නම් මනඃකල්පිත ග්‍රාමයක වෙසෙන දෑත්තා, නම් නාහෙට නාහන විසේකාර කීඩෑ පැංචාගේ කේවල චරිතය කේන්ද්‍ර කර ගනිමින් රචිත තත් කෘතිත්‍රය ළමා පැටියන්ගේ පටන් නව යොවුනන් දක්වා විහිදුණු පාඨක පරාසයෙහි සියල්ලන් අමන්දානන්දයට පත් කළා වූ සර්වකාලීන ප්‍රසාදයට බඳුන් වූ කෘතියක් වශයෙන් අදටත් වැජඹෙයි. මේ නිර්මාණත්‍රය ගුවන් විදුලි නාටක, කාර්ටූන් චිත්‍රපට හා වේදිකා නාට්‍ය ලෙස විවිධ මාධ්‍යයන්ට අනුරූපී ලෙස අනුවර්තනය ව නිෂ්පාදනය කෙරිණි. රුසියානු සංගමයෙන් පිරිනැමෙන එන්.කේ. ක්රුප්ස්කයා රාජ්‍ය සම්මානය ද තත් නිර්මාණය උදෙසා නොසොව් වෙත සමර්පණය කෙරිණි.

නොසොව්ගේ නිර්මාණවල පරාසය පෘථුල වූවකි. පෙරපාසැල් වියෙහි වූවන්, ප්‍රාථමික පාඨශාලයීය ශිෂ්‍යයන් ඉලක්ක කර ගනිමින් රචිත දිගු හා කෙටි පබැඳුම්, සාහිත්‍යයික රචනා විලාසයෙන් ජ්‍යෙෂ්ඨ පාඨශාලයීය ශිෂ්‍යයන් උදෙසා රචිත හාස්‍යොත්පාදක කතා යනාදී වශයෙන් වූ සුවිශාල වපසරියක් වටලමින් මේවා ලියැවී ඇත. මේ ප්‍රබන්ධ කතාන්තරයන්හි නොසොව්ගේ පෞද්ගලික සිතිවිලි, ආවර්ජනා හා ජීවිතය පිළිබඳ වූ ප්‍රතිෂ්ඨාවන්ගෙන් සැදුම් ලත් සමස්ත ලෝකයක් ම අන්තර්ගතය.

නොසොව් ළමුන් මුහුණ පාන්නා වූ  වැදගත් වූත් ගැඹුරු වූත් ප්‍රශ්න පිළිබඳ ව අවධානය යොමු කරන්නේ චරිතවල දෝෂ ස්ථාන හාස්‍යයට ලක් කරමිනි. මන්ද යත් හාස්‍යය වෙනත් පිළියම් පරයමින් නිශ්චිතව ම සහනය සලසන ඔසුව වන බැවිනි. කිසිවිටෙක් රළු

පරළු ආකල්පයකින් චරිත දෙස නොලැබූ නොසොව් මූලිකව දයා පරවශ වූත් ණී විනෝදකාමී වූත් දෘෂ්ටියකින් ඒවා විනිවිද දකියි. කවර අවස්ථාවකවත් ඔහුගේ දායාද ගුණය සීමාන්තික 'අතිරසයක්' වන්නේ නොවේ. මෙහිලා බොරිස් ෂිට්කොව් නම් ලේඛකයා තමාට අනුග්‍රහශීලී වන හා තමා ''නරක් කරන'' වැඩිහිටියන් විෂයෙහි ලා බාලයන් දක්වන ආකල්පය පිළිබඳව කියූ දෑ සිහිකැඳවනු වටනේය.

> ''අනේ කොච්චර හුරතල් පැටියෙක් ද? වැඩිහිටි නැන්දනියක් තෙපළන්නීය... ඇරපු අතක් නෑ බෝනික්කෙක් මයි... අනතුරුව ඇය දරුවා සිය උණුසුම් ළයට දෘඪ ග්‍රහණයෙන් තුරුළු කර ගනියි ... එහෙත් බෝනික්කා නැන්දාට අතින් පයින් පහර දෙමින් මෙම හැඟීම්බර ආලිංගනයෙන් මිදෙන්නට තැත් කරයි... දරුවාට බෝනික්කෙකු වීමට අවශ්‍යතාවක් නැති හෙයින් වැඩිහිටියන්ගේ මෙම ප්‍රමාණාතික්‍රාන්ත සුරතලය අප්‍රසන්න හිසරදයකි... මීට පරස්පර ව වැඩිහිටියන්ගේ මේ සුස්ම සිර කරවන ප්‍රමෝදයට වහා අනුගතව ඔවුන්ට අවශ්‍ය පරිදි හැසිරෙන බාලයන් ද නැත්තේ නොවේ... ඔවුහු යෝග්‍යාකාරයෙන් නිසි ප්‍රතිචාර දැක්වීම අරඹමින් වැඩිහිටි සුරතලුන්ගේ සතුටු සාගරයෙහි ගිලෙති...'' [6]

නොසොව් තදබල අයුරින් කවර මාදිලියක හෝ අනුග්‍රහශීලිත්වයකට විරෝධය දක්වා සිටී. ඔහු දරුවන් විෂයෙහි දක්වන්නේ තුල්‍යයන්ට දක්වන්නා වූ ගෞරවයකි. ඔහු හා දරුවන් අතර ගොඩනැඟෙන්නේ සහෘද සංවාදයකි. ඔහු ළමුන්ගේ හද බසින් ඔවුන් අමතා හද ගැබ් දොරගුළු විවර කරන්නේ යට කී උපක්‍රමයෙහි ආනුභාවයෙනි. වැඩිහිටියන්ට ළමා ලෝකය ව්‍යාකූල වූ ද, බහු විධ වූද, අවබෝධ කර ගැනීමට දුෂ්කර වූ ද ප්‍රපංචයකි. බාල පරම්පරාව උදෙසා වූ නිර්මාණාත්මක ප්‍රබන්ධකරණයට ප්‍රවිෂ්ට වන සෑම අයෙක් ම පාහේ දරුවන්ගේ ලෝකයට ඇතුළු වන දොරටුවෙහි යතුර සොයා ගැනීමට සමත් නොවෙත්. එහෙත් නොසොව් ඇසිල්ලකින් දරුවන්ගේ සානුකම්පාය දිනා ගනිමින්, ඔවුන් හා සම්බන්ධතාවක් ගොඩනඟා ගන්නේ ඔහුගේ නොසිඳෙන මනඃසෘෂ්ටියේත්, හාස්‍යයේත්, අකුටිලත්වයේත්, දයනීයත්වයෙන් අනුහසිනි. නොසොව්ගේ කතා කීමේ ශෛලිය වූ කලී පාඨකයා ක්‍රියාදාමයෙහි උද්වේගී අවස්ථාවක ක්ෂණිකව ස්ථානගත කරන්නකි. මෙය බාලක

බාලිකාවන්ගේ හද දිනා ගන්නා වූ ද මනස පොබයන්නා වූ ද රීතියක් වන්නේය. ආරම්භක වාක්‍යයෙන් ම පාඨකයා චරිතවල ජීවිතාභ්‍යන්තරයට ප්‍රවේශව ඔවුන් මුහුණ දෙන වික්‍රමයන් හා ක්‍රියාශීලී ලෙස සම්බන්ධ වෙයි. **මීෂාගේ සුප් හැළිය** නම් කතාවෙහි කථානායක දෙපළ වන කෝල්යා හා මීෂා පාසැල් නිවාඩු කාලය ගත කිරීමට පිටිසර ගම්මානයක් බලා යති. එහිදී ඔවුන්ට වැඩිහිටියන්ගේ ඇලුම් බැලුම් වලින් තොර ව පුරා දින දෙකක් එකලාව ම තමන්ගේ කටයුතු බලා කියා ගන්නට සිදු වෙයි. මෙය සංචරණ පියා යුග කපා නිවාස අඩස්සියෙහි රැඳ වූ පාඨක මනසෙහි ඊර්ෂ්‍යා පරවශ හැඟීමක් ජනනය කරවන්නක් නොවන්නේද? සැබවින්ම මීෂා හා කෝල්යා භාග්‍යවන්තයෝ වෙත්! එතෙකදු දින දෙකක් පුරා ඔවුන් හමුවේ ජයගන්නට ඇති අභියෝග බොහෝය. තමාට තනිව ම උයාපිහා ගැනීමට හැකි යැයි මීෂා කෝල්යගේ මවට පුරසාරම් බසින් උදක් ම කියා සිටියෙන් කිසිදු ශංකාවකින් තොරව ඇය ඔවුන් තනිකර දමා පෙරළා නගරය වෙත යන්නීය. එදින රාත්‍රියෙහි සූපශාස්ත්‍රයෙහි තමා කෙළ පැමිණියෙකැයි උදම් අනිමින් මීෂා පිසමනෙහි නිරතවද්දී නොදැනුවත්කම හේතුවෙන් සූපය පිළිස්සී යයි.

> ''මීෂා නුඹ අපේ ලොකු ම ලොකු කෝකියා මොනවද උයන්නේ? මොනව හරි ඉක්මනට ඉදෙන දෙයක්. බොහොම බඩගිනියි.''
> ''සුප් හදමු. ඉක්මනට හදන්න පුළුවනි.'' මීෂා කිව්වා.
> ''හොඳයි එහෙනම් හදමු.''
> ''නුඹ වතුර වැඩිය දැම්මොත් දියාරුවට හිටීවි''
> ''කමක් නැහැ. අම්මා හැමදාම එහෙම තමා කරන්නේ. නුඹ ලිපට දර දාපන්. සුප් හදන එක මම බලා ගන්නම්.''

මීෂා මට අණ කළා ...

> ''වතුර ඉවර වෙලා'' මීෂා කීවා.
> ''දැන් ඉතින් මොනවා කරන්නද? වතුර ගන්න ළිඳට යන්න ඕනැ. ඇහැට ඇන්නත් පේන්නෙ නැති තරම් කළුවරයි.''
> ''බොරු බය! මම වතුර ගේන්නම්''

මීෂා එහෙම කියලා, ගිනි පෙට්ටියත් අරගෙන ලණුව බාල්දියකින් බැඳගෙන ළිඳට ගියා... විනාඩියකින් ඔහු ආපසු ආවා.

> ''වතුර කෝ?'' මං ඇහුවා.

''වතුර ද? වතුර ළිඳේ''
''ළිඳේ වතුර තියෙන බව මම දන්නවා. වතුර බාල්දිය කෝ?''
''බාල්දිය ළිඳේ'' මීෂා කිව්වා.
''ළිඳේ ... ළිඳේ ඒ කොහොමද?...''
''ඔව් ළිඳේ....''
''අත හැරිය ද?''
''ඔව් අතහැරුණා ...'' ඔහු පිළිතුරු දුන්නා..''[7]

සූපය පිසීමෙහි ආශාව අත්හැර දමන මිතුරන් විසින් පිළියෙල කරන්නට යෙදුණු මාළු බැදුම ද නිසි පදම නොදත් හෙයින් භාජනයෙහි ම කරවෙයි.!

''විනාඩි දෙකයි. රෑට කෑමට මාළු ලෑස්තියි.''
මීෂා පුරසාරම් දොඩවනවා.

මීෂා මඩකරි ටික කපලා සුද්ද කරලා තාච්චුවට දැම්මා. තාච්චුව රත් කළා. දැන් මාළු ටික තාච්චුවට ඇලිලා තියෙනවා.

''මීෂා කවුද ඔහොම මාළු බදින්නේ.... තෙල් නැතුව!''

ඒ පාර මීෂා සූරියකාන්ත මල් තෙල් බෝතලයකින් තාච්චුවට තෙල් වත් කරලා ඒක ලිප ඇතුළට තිබ්බා. එක පාරටම 'හෝස්' ගාලා ගින්නක් ඇති වුණා ...

''දැන් ඉතින් අපි බදින්නේ මොනවද? '' මීෂා ඇහුවා.
''ඉතින් මීට පස්සේ නම් නුඹට කිසිම දෙයක් බදින්ට දෙන්නෙ නැහැ. නුඹ ගෙදර තියෙන කෑම ජාති විනාශ කරනවා විතරක් නෙවෙයි. ගෙටත් ගිනි තියාවි! නුඹ කළ දේ හොඳටම ඇති.''[8]

එදින රැයෙහි මීෂාට හා කෝල්යාට සාගින්නෙන් පසුවන්නට සිදු වේ. උද්ගත වූ තත්ත්වය ඔවුන්ට සිතන්ට පොළඹවයි. තමන්ට සෑම දෙයක්ම කළ හැකි යැයි තරයේ විශ්වාස කිරීම පමණක් හුදෙක් සෑහෙන්නේ නොවේ. දුටු මනතින් අතිශයින් පහසු යැයි හැඟෙන දෑ පවා නිවැරදි ව කිරීමට හැකියාව හා සංයමය වර්ධනය කරගත

යුත මනාය. නොසොව්ගේ ප්‍රබන්ධ රීතියට ප්‍රරූපී ආකාරයෙන් මෙහි දී දෛනික ජීවිතයෙහි කුඩු මහත් අර්බුදාත්මක අවස්ථාවන්හි ස්ථානගත කෙරුණු චරිත ලවා ඒවාට සිතන්නට සලස්වයි. දරුවන් විසින් වැරදි සිදු කළ ද කම් නැත. එහෙත් එහි ප්‍රතිඵල වශයෙන් තනිව ම සිතන්නට උගෙන නිවැරදි විසඳුමට ළඟා වීමෙහි ක්‍රමවේදය කරා ළඟා වීමේ කලාව පැටි වියෙහි වූ බාලක බාලිකාවන් විසින් ප්‍රගුණ කළ යුතු මනාය.

මෙම පරීක්‍ෂණ මඟින් ඉගෙන ගැනුමේ කලාව නොසොව්ගේ සෑම කතාන්දරයකට ම පාහේ ආවේණික වූ ලක්ෂණයකි. දරුවෙක් හෝ දැරියක් හෝ යම් යම් දේවල්වල සත්‍ය සොයාගනු පිණිස පරීක්‍ෂණවල නිරත වෙයි. සෙල්ලම් ටෙලිෆෝනය කතාවෙහි දී මෙම අතෘප්තකර කුතුහලයෙහි ප්‍රතිඵලය වන්නේ කැඩී බිඳී ගිය තවදුරටත් භාවිතයට ගත නොහැකි උපකරණයකි. ටෙලිෆෝනය නිමවා ඇත්තේ කෙසේදැයි දැනගනු පිණිස එය ගලවා බැලීමට කථානායකයා වන මීෂාට ඇත්තේ අනල්ප ආශාවකි.

''... මීෂා ටෙලිෆෝනය කෑලිවලට ගලවලා .... ටෙලිෆෝනයට සවිකර ඇති බැටරිය ගලවලා සීනුවත් කෑලිවලට වෙන් කරලා ... කන්පෙත්තේ ඉස්කුරුප්පු ඇණ ගලවනවා ..!

''නැවතියන් ? නුඹ මොකටද ටෙලිෆෝනය කැඩුවේ?'' මම ඇහුවා.

''මම කැඩුවේ නැහැ. කෑලිවලට ගැලෙව්වා.... මේක හදලා තියෙන්නෙ කොහොමද කියලා දැනගෙන ආපසු සවි කරනවා ...''[9]

සිතැඟිය විසින් මෙහෙයවනු ලැබූ මීෂා විසින් කඩ කඩ කෙරුණු ටෙලිෆෝනයේ, ක්‍රියාකාරිත්වයට හානි පැමිණ, තාවකාලික ව අකර්මන්‍ය වුව ද අනාගත පර්යේෂකයකු වීමෙහි මඟට මිනිස් දරුවන් අවතීර්ණ කරවන්නේ කුතුහලය විසින් මෙහෙයවුනු ගවේෂණ කාමය ම නොවන්නේද?

**ප්‍රීතිමත් පවුල නම් [The Jolly Family]** තරමක් දිගු කතාන්තරයෙහි දී කෝල්යා හා මීෂා ගෘහස්ත බීජෞෂකයකින් කිකිළි බිජුවට රැක්කවීමට සැලසුම් කරති. මෙහිදී කර්තෘ අප කැඳවා ගෙන යන්නේ සංකීර්ණතර වික්‍රමයක් වෙත ය. සමාරම්භයේ දී මේ ආධුනික

පර්යේෂක දෙපළ හට තමන් කරන්නට යන කාර්යයෙහි බරපතලකම පිළිබඳව වැටහීමක් නැත. එහෙත් පර්යේෂණය දියත් කළ තැන් පටන් කෙතරම් බාධා පැමිණියත් එය අතහැර දැමීම ඔවුන්ගේ පිළිවෙත වූයේ නොවේ. රාත්‍රිය පුරා නිදි වරමින් බීජෝෂකය පරීක්ෂා කිරීමෙහි සතතයෙන් නිරත වීමෙහි ප්‍රතිඵල වශයෙන් ඔවුහු තදබල ලෙස විඩාපත් ව ගත සිතෙහි ජීවගුණය ද මිලාන කර ගනිති. එවිට පාසල් මිතුරු කැළ ඔවුන්ට ආධාර පිණිස පැමිණෙත්. මේ අතර විවිධ මාදිළියේ අනපේක්ෂිත වික්‍රමයන්ට මුහුණ දෙන්නට සිදු වෙයි. ගණනයට අනුව නියමිත දිනයෙහි දී පූර්ව සැලසුම් ප්‍රකාර ව කුකුළු පැටවු බිජුවට බිඳ එළියට නොපැමිණෙත්! එහෙත් සුමිතුරෝ එකාවන් ව ඉවසිලිමත් ව දිරිවඩා සාමූහික ප්‍රයත්නයක ඵල වශයෙන් අවසානයේ කෙසේ හෝ ජීවමාන කුකුළු පැටවුන් කෘත්‍රිම බීජෝෂකයකින් ලබා ගැනීමට සමත් වෙති.

''කෝල්යා මේ බලපන්! නොම්මර එකොළහේ බිත්තරයත් බිඳිලා!'' මීෂා කෑ ගැහැව්වා.

''චාහ්! අපේ කොල්ලො කට්ටිය ගෙදර ගියා. හැබෑ අවාසනාවක්. අඬගහන්නට බෑ. හොඳටම රෑ වෙලා...'' මීෂා කණගාටු වුනා.

''ඒකට කමක් නැහැ. හෙට උදේට පණ ඇති කුකුළු පැටවු දකින්න පුළුවන් ...''[10]

නොසොව්ගේ ප්‍රබන්ධයන්හි හමුවන ළමා චරිත බොහොමයකට ම සාධාරණ ගුණයක් වන්නේ පරිකල්පන ශබ්‍යතාවෙන් අනූන වීමය. **කතාන්දර කියන්නෝ** (Story Tellers) නිර්මාණයෙහි හමුවන යහළුවන් දෙදෙනා වන මිෂුත්කා හා ස්ටැසික් විනෝදය පිණිස අතිශය අභව්‍ය සුරංගනා ලොවකට මනසින් පිවිස වික්‍රමාන්විත සිහින මවත්! මිෂුත්කා හිම කිරම විශාල භාජනයක් එක කටට ගිල දැමීමෙහි සපනෙකි. ඔහුට දෙවැනි නොවන ස්ටැසික් නම් ළමා වීරයා, ඉදින් කිඹුලකු විසින් ගිල දමනු ලැබුවහොත් ඔහු හා සටන් වැද ජීවමාන ව කිඹුල් මුවින් එළියට ආ හැකි ජගතෙකි. දෙදෙනාට ම අවශ්‍ය වන්නේ එකිනෙකා පරයා තම කාර්ය සාඵල්‍යය පිළිබඳ ව උදම් ඇනීමටය. අනපේක්ෂිතාකාරයෙන් මෙම අවිහිංසක මනඃසෘෂ්ටිමය ලෝකයට සැබෑ බොරුවක් පිවිසෙයි. ඉගෝර්

ඔවුන්ගේ කථෝපකථනයට සවන් දී මිතුරන්ගේ කතා ගෙතීමේ හැකියාව පරිහාසයට ලක් කරයි. ඔහුට අනුව තමා වනාහී අංක එකේ බොරු කීමෙහි සමතාය! ඉගෝර් එදින උදෑසන ජෑම් බඳුනක් සොරා ගෙන එය හිස් කර මවට මුසා බස් දොඩයි. වංචනයෙන් සිය කුඩා නැගණිය චූදිතයා බවට පමුණුවා ඔහු වරදින් ගැලවෙයි.

එහෙත් මිෂුත්කා හා ස්ටැසික් මේ ගණයේ බොරු, යුක්ති සහගත හෝ වික්‍රමාන්විත යැයි නොසතති.

''ඔයාගෙ නංගි නිස්කාරණේ දඬුවම් වින්දේ ඔයා නිසා'.... එයා පාවා දීලා ඔයා හොඳට ඉන්නවා! මිෂුත්කා කීවේය.

''නුඹ හැබෑ බොරු කාරයෙක් ! යනවා යන්න මෙතැනින්! අපිට ඔහේ ගාව ඉඳ ගන්ඩවත් ආසාවක් නැහැ....''[11]

මෙම ක්ෂුද්‍ර ප්‍රබන්ධයෙහි දී කර්තෘ සූක්ෂ්ම ලෙස හාස්‍ය රස මාධ්‍යයෙන් ගැඹුරුතර හා වැදගත් ගුරු අරුත් සපයන අයුරු අපට නිරීක්ෂණය කළ හැකිය. මෙනයින් නොසොව්ගේ සෑම ප්‍රබන්ධයක ම පාහේ හොඳ නරක පිළිබඳ වූ සුසිරිත් දහමින් මාත්‍රයක් අනුපානු වශයෙන් ගෙන රෝපණය කර ඇත.

දයා පරවශ ස්වභාවය හා තුල්‍යයන්ට දක්වන උණුසුම් සහානුභූතික ප්‍රතිචාර ළමා වගට නෛසර්ගික වූ ගුණාංගයන්ය. එහෙත් අන්‍ය චරිතාංග ලක්ෂණ පරිදි ම ළමයා විසින් මේවා අනුක්‍රමයෙන් අත්දැකීම් මඟින් අභිවර්ධනය කරගත යුතු මනාය. මෙහි ලා නොසොව්ගේ කතා ආධාරෝපකාරී වන්නේ සමාජයීය සබඳතා ගොඩනඟා ගැනීමෙහි හා පවත්වා ගැනීමෙහි ලා සදුපදේශ සපයන බැවිනි. අනෙකාට ආධාර කිරීමට ඇති රුචිය, පීඩිතයාට නැඟී සිටීමට මිත්‍රත්වයේ හස්තය දිගු කිරීමට නොමැළි වීම හා අනෙකා උසුලන බර ඉසිලීමට ඉදිරිපත් වීම යන සද්ගුණ නොසොව්ගේ ළමා වීරයන් හට නෛසර්ගිකය. දරුවාගේ තුල්‍යයන් මුහුණ දෙන ගැටලු නොසොව් විසින් නිරාකරණය කරනු ලබන්නේ ළමයින්ට සීහෙන සරල උපක්‍රම මාධ්‍යයෙනි; කුටිල මිහිරි වදන් හෝ අවිශ්වසනීය උද්වේගීකර අවස්ථා බැහැර ලීමේ රීතියකට අනුගත වෙමින් **කතාන්දර කියන්නෝ** කතාවෙහි මිෂුත්කා හා ස්ටැසික් ඉගෝර්ගේ නැගණිය වූ ටැන්යා නොකළ වරදකට දඬුවම් විඳීම පිළිබඳව බෙහෙවින් දුක් ගනිති.

''ඇයි ඔයා අඬන්නේ? ... '' මිෂුත්කා ඇසුවේය.

''අම්මා මට එළියට ගිහින් සෙල්ලම් කරන්න දෙන්නෑ...''

''ඇයි ඒ?''

''ජෑම් බෝතලේ නිසා ...මං ඒක කෑවේ නෑ ... ඉගෝර් අයියා අම්මට ගතු කීවා මං ඒක කෑවා කියලා ...''

''එයා තමයි ඒක කෑවේ.... කාලා ඇවිත් අපිත් එක්ක පුරසාරම් දෙඩුවා. නාඬා ඉන්න. අපේ ගෙදර ආවොත් මගේ අයිස්ක්‍රීම් එකෙන් බාගයක් දෙන්නම්!'' මිෂුත්කා තෙපළේය.

''මගේ එකෙනුත් බාගයක් දෙන්නං ... මං එකම එක පාරක් විතරක් ලෙවකාලා ... ඔයාට සේරම දෙන්නං'' ස්ටැසික් පොරොන්දු විය... [12]

සෑම නොසොව් කතන්දරයක් ම පාහේ ළගන්නා සුළුය. රසවත්ය. දරුවා යනු කෙතරම් නිර්මල ආශ්චර්යමත් වස්තුවක් ද යන්නත්, යහපත ඔහු කෙතරම් ශීඝ්‍රයෙන් ග්‍රහණය කර ගන්නේ ද යන්නත්, කෙසා ආශ්චර්යමය ප්‍රඥා මහිමයක්, උණුසුම් කාව්‍යමය සංකල්පනා සංචිතයක් ඔහු සතුව පවතින්නේ ද යන්නත්, මෙන් ම, ඔහුට කොපමණ අවධානයක්, සුබෝධනයක් හා ඇල්මක් ප්‍රදානය කළ යුතු ද යන්නත් පිළිබඳ ව නොසොව් අපට ඉඟි කොට සිටියි.

**ආන්තික සටහන්:**

1. උපතේ සිට අවුරුදු දෙක දක්වා ළදරු වියත්, අවුරුදු තුනේ සිට පූර්ව ළමා වියත්, අවුරුදු හයේ සිට දොළහ දක්වා මධ්‍යම අවධියත්, අවුරුදු දොළහේ සිට දහ අට දක්වා නව යොවුන් වියත් නියෝජනය වෙතියි සැලකේ.
2. i. රඩ්ලොව්, එන්. (මුද්‍රිත වර්ෂය සඳහන් ව නැත), සිංහල අනුවාදය රැදිගු, දූදිගම, වී. **පින්තූර කතා**, සී/ස ප්‍රොග්‍රෙසිව් පබ්ලිෂිං හවුස් (පුද්ගලික) සමාගම, කොළඹ 08.
   ii. මිනායෙව්, යෙ, නවතම මුද්‍රණය, 2004, අනුවාදය රැදිගු, දූදිගම, වී. **ලස්සන වසීලිස්සා - රුසියන් සුරඟනා කතා**, කැටපත ප්‍රකාශන, කොළඹ 08.
   iii. **On seashore far a Green Oak Towers – A Book of Tales–** (English translation), 1983, Raduga Publishers, Mosscow.

03. පහත සඳහන් කෘති මෙහි ලා අප විසින් පරිශීලනය කෙරිණි.
- නොසොව්, නිකොලායි, 2011, **තෝල්යා සහ යහළුවන්ගේ හපන්කම්** (තෝ.ය.හ), අනුවාදය රැදිගු, දූදිගම වී. විතාන, ආරියරත්න, කුරුලු පොත්, රාජගිරිය.

- නොසොව්, නිකොලායි, (නව සංස්කරණය) **වීත්යාගේ ළමා විය**, සිංහල අනුවාදය, සිරි සරණංකර හිමි, උඩකැන්දවල, කුරුලු පොත්, රාජගිරිය.
- නොසොව්, නිකොලායි, 2003 දෙවැනි මුද්‍රණය, **දූත්තගෙයි යාළුවන්ගෙයි හපන්කම්** 1, (දූ.යා.හ.) කුරුප්පු ඩී.බී., කුරුලු පොත්, රාජගිරිය.
- එම, **දූත්තගෙයි යාළුවන්ගෙයි හපන්කම්** 2, කුරුලු පොත්, රාජගිරිය.
- Nosov, Nikolai, 1984, **Eleven Stories for Boys and Girls (E.S.B.G.),** Raduga publishers, Moscow.

4. **Introduction E.S.B.G.**
5. එකමත් එක කාලෙක සුරංගනා දේසෙ නගරෙක හිටියා කීඩැවෝ කියලා මිනිස්සු ජාතියක්... ඒ නගරය හරි ලස්සන එකක්... හැම ගෙයක් වටේම හොඳ හොඳ මල් ජාති වැවිලා. ඩේසියා, කපුරු මල්, සූරියකාන්ත. වීදි ඔක්කොටම දාල තිබුණෙ මල්වල නම්. කොතල වීදිය, ඩේසියා පටු මාවත, රෝස මාවත, අන්න ඒක නිසයි මේ නගරෙට කුසුම් පුරය කියලා කියන්නෙ... (දූ.යා.හ. පිටුව 1)
6. **Introduction E.S.B.G.**
7. **තෝ.ය.හ.** පි. 38-42
8. එම. පි. 45
9. එම. පි. 71-72
10. එම පි. 102
11. **E.S.B.G. 58-59** (පරිවර්තනය අපගෙනි)
12. **Ibid 59-60** (පරිවර්තනය අපගෙනි)


## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය:

1. නිකොලායි නොසොව්. 2011, **තෝල්යා සහ යහළුවන්ගේ හපන්කම්**, අනුවාදය දූදිගම වී. රුද්‍රිගු, ආරියරත්න, විතාන. කුරුලු පොත්, රාජගිරිය.
2. නිකොලායි නොසොව්, (නව සංස්කරණය), **වීත්යාගේ ළමාවිය**, අනුවාදය උඩකැන්දවල සිරි සරණංකර හිමි, කුරුලු පොත්, රාජගිරිය.
3. නිකොලායි නොසොව්, 2003, **දූත්තගෙයි යාළුවන්ගෙයි හපන්කම්** 1, අනුවාදය, ඩී.බී. කුරුප්පු, කුරුලු පොත්, රාජගිරිය.
4. නිකොලායි නොසොව්, **දූත්තගෙයි යාළුවන්ගෙයි හපන්කම් 2**, එම -
5. එන්. රැඩ්ලොව්, (මුද්‍රිත වර්ෂය සඳහන්ව නැත) **පින්තූර කතා**, සී.ස. ප්‍රොග්‍රෙසිව් පබ්ලිෂිං හවුස්, (පුද්ගලික) සමාගම, කොළඹ 08.
6. යෙ. මිනායෙව්, 2004 මුද්‍රණය, **ලස්සන වසීලිස්සා - රුසියන් සුරංගනා කතා**, අනුවාදය, දූදිගම වී. රුද්‍රිගු, කැටපත ප්‍රකාශන, කොළඹ 08.
7. Nikolai Nosov, 1984, **Eleven stories for Boys and Girls**, Raduga Publishers, Moscow.
8. **On seashore far a Great Oak Towers (A Book of Tales)**, (English Translation), 1983, Raduga Publishers, Moscow.
9. Reynolds Kimberley, 2011, **Childrens' Literature, A very short Intodruction,** Oxford, Oxford University Press.